# කර්මාන්ත

**සමස්ත උපනතීන්**

පසුගිය වර්ෂය හා සංසන්දනය කර බලන කල 1986 වර්ෂයේදී කර්මාන්ත අංශයේ සැළකිය යුතු ප්‍රගතියක් දක්නට ලැබුණි. පසුගිය වර්ෂයේ සියයට 5 ක වර්ධනයට සාපේක්ෂව 1986 වර්ෂයේදී කර්මාන්ත නිමැවුම සියයට 12 කින් මූර්ත ලෙස වැඩි විය. කර්මාන්ත නිමැවුමේ මෙම ඉහළ වර්ධනය පෞද්ගලික අංශයේ මෙන්ම රාජ්‍ය අංශයේ කර්මාන්තවල වඩා හොඳ ක්‍රියාකාරිත්වයක් නිසා සිදු වූවකි. වර්ෂය තුළදී පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිමැවුම් වටිනාකම සියයට 15 කින්ද, රාජ්‍ය අංශයේ කර්මාන්තවල නිමැවුම් වටිනාකම සියයට 8 කින්ද වැඩි වී ඇත.

රාජ්‍ය අංශයේ කර්මාන්තවල සතුටුදායක ක්‍රියාකාරිත්වය, ආහාර, පාන වර්ග සහ දුම්කොළ සහ දැව හා දැව නිෂ්පාදිත යන අංශ හැර අන් සියළුම අනු අංශවල වඩා හොඳ නිමැවුම් තත්ත්වයක් මගින් පෙන්නුම් කෙරිණි. උතුරු පළාත්වල පැවති කලබලකාරී තත්ත්වයන් හේතුකොටගෙන පරන්තන් රසායනික ද්‍රව්‍ය සංස්ථාව, රාජ්‍ය දැව සංස්ථාව සහ ලංකා ඛනිජ වැලි සංස්ථාව යන ආයතනවල ක්‍රියාකාරිත්වයට බාධා පැමිණුනි.

පෞද්ගලික අංශය ගත් කල සියළුම නිෂ්පාදන අනු අංශවල නිෂ්පාදනයේ වැඩි වීමක් වර්ෂය තුළදී වාර්තා වී ඇත. විශාල වශයෙන් නිෂ්පාදනය වැඩි වූ අංශ අතර රෙදිපිළි හා ඇඟළුම්, ආහාර, පාන වර්ග සහ දුම්කොළ සහ රසායනික ද්‍රව්‍ය යන අංශ වැදගත් තැනක් ගනී. වර්ෂය තුළදී කර්මාන්ත අංශයේ දක්නට ලැබුණු සැළකිය යුතු ලක්ෂණයක් වන්නේ බටහිර රටවලින්, විශේෂයෙන් යුරෝපා ආර්ථික ප්‍රජාවට අයත් රට වලින් ඇඟළුම් භාණ්ඩ සඳහා ලැබුණු ඉහළ ඉල්ලුමයි. 1986 දී කාර්මික අපනයන සියයට 11 කින් වැඩි වීමට මෙය ප්‍රධාන හේතුවක් විය.

රාජ්‍ය අංශයේ කර්මාන්ත ව්‍යවසායයන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා වර්ෂය තුළදී පියවර රැසක් අනුගමනය කරන ලදී. ලංකා තුනී ලැලි සංයුක්ත මණ්ඩලයේ 'සාලාව' කර්මාන්ත ශාලාව දිගින් දිගටම අලාභ පෙන්වූ බැවින් 1986 මාර්තු මස සිට එය වෙනමම ඒකකයක් ලෙස පවත්වාගෙන යන ලදී. රාජ්‍ය අංශයට අයත්ව තිබූ උළු කම්හල් තුනක් පෞද්ගලික අංශයට පැවරීමේ කටයුතුද වර්ෂය තුළදී නිමාවට පත් විය. ජාතික ඇසුරුම් ද්‍රව්‍ය සංස්ථාව, ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාව සහ රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ යූරියා නිෂ්පාදන ඒකකය දිගින් දිගටම අලාභ පිට පවත්වාගෙන ගිය බැවින් එම ආයතන මාර්තු මාසයේදී වසා දමන ලදී.

ලිහිල් ආර්ථික ප්‍රතිපත්ති කර්මාන්ත ක්‍රියාවලිය කෙරෙහි තවදුරටත් සැළකිය යුතු ලෙස බලපෑම් ඇති කෙරිණි. ආනයන වලින් ඇති වන තරඟකාරිත්වයට මුහුණ දීම සඳහාත්, අපනයන වෙළෙඳපලවල් පවත්වා ගැනීමට සහ පුළුල් කර ගැනීමට හැකි වන අයුරින් තරඟකාරී තත්ත්වයක් ඇති කර ගැනීම සඳහාත්, වෙනස් වන විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් සහ සංශෝධිත තීරු බදු ප්‍රතිපත්තියක් යටතේ කර්මාන්ත කරුවන්ට ඔවුන්ගේ භාණ්ඩවල වියදම් අඩු කර ගැනීමේ සහ තත්ත්වය ඉහළ නැංවීමේ අවශ්‍යතාවයට මුහුණපෑමට සිදු වුණි. එසේම අලෙවිය, ඇසිරීම සහ නව තාක්ෂණික ක්‍රම යොදා ගැනීම කර්මාන්ත අංශයේ දක්නට ලැබුණු තවත් වැදගත් ලක්ෂණයක් විය. තීරු බදු ප්‍රතිපත්තිය මගින් අපනයන කෙරෙහි නැඹුරු වූ කර්මාන්ත දිරි ගැන්වීමෙන් සහ එකතු කළ අගය වැඩි, ආනයන ආදේශන කර්මාන්ත සඳහා අවශ්‍ය ප්‍රමාණයේ ආරක්ෂණයක් ලබා දීමෙන් කර්මාන්ත සංවර්ධනය දිරි ගැන්වීමෙහිලා වැදගත් සේවයක් ඉටු විය.

**ආයෝජන**

1986 වර්ෂය තුළදී, විදේශීය ආයෝජන උපදේශක කමිටුව විසින් අනුමත කරනු ලැබූ නව යෝජනා ක්‍රම ඉහළ මට්ටමක ආයෝජන හා නිෂ්පාදන හැකියාවන් පෙන්වීය. පසුගිය වර්ෂයේ අනුමත කළ කාර්මික නිෂ්පාදන යෝජනා ක්‍රම 30 හා සැසඳීමේදී මෙම වර්ෂයේදී

අනුමත කළ කාර්මික නිෂ්පාදන යෝජනා ක්‍රම 41 සැළකිය යුතු වර්ධනයකි. මෙම යෝජනා ක්‍රම මගින් රුපියල් දශ ලක්ෂ 644 ක ආයෝජනයක් බලාපොරොත්තු වන අතර, එහි විදේශීය කොටස රුපියල් දශ ලක්ෂ 130 ක් වෙයි. රෙදිපිළි සහ ඇහළුම් අංශයේ අළුත් ආයෝජනයන් අධෛර්යමත් කිරීමේ අරමුණ කෙරෙහි නැඹුරුවීම 1986 වර්ෂයේදී අනුමත කළ යෝජනා ක්‍රම වලින් 28 ක්ම රෙදිපිළි සහ ඇහළුම් නොවන කර්මාන්ත අංශවල වීමෙන් පිළිඹිබු විය. මෙම යෝජනා ක්‍රමවල මුළු සේවා නියුක්ති හැකියාව 5,570 ක් යයි ගණන් බලා ඇත.

මහ කොළඹ ආර්ථික කොමිසම (ම.කො.ආ.කො.) 1986 දී යෝජනා ක්‍රම 10 ක් අනුමත කළ අතර, එහි අපේක්ෂිත ආයෝජනය රුපියල් දශ ලක්ෂ 188 ක් වේ. මෙම ව්‍යාපෘතීන්වල මුළු සේවා නියුක්ති හැකියාව 2,960 ක් යැයි ගණන් බලා ඇත. 1985 දී ම.කො.ආ.කො. යෝජනා ක්‍රම 13 ක් අනුමත කළ අතර, එහි අපේක්ෂිත ආයෝජනය රුපියල් දශ ලක්ෂ 286 ක් විය. වර්ෂය අවසානය වනවිට ම.කො.ආ.කො. විසින් අනුමත කොට තිබූ මුළු යෝජනා ක්‍රම සංඛ්‍යාව 221 කි. මේවායින් ආයතන 126 ක් විවිධ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ම.කො.ආ.කො. සමග ගිවිසුම් අත්සන් කොට තිබුණි.

කර්මාන්ත හා විද්‍යා කටයුතු, පේෂ කර්මාන්ත සහ ධීවර යන අමාත්‍යාංශවලට අදල දේශීය ආයෝජන උපදේශක කමිටු වර්ෂය තුළදී ව්‍යාපෘති 321 ක් අනුමත කරන ලදී. මෙම කමිටු 1985 දී අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාව 344 කි. 1986 දී අනුමත කළ ව්‍යාපෘති වලින් අපේක්ෂිත ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 400 ක් වූ අතර, ඒවායින් අපේක්ෂිත සේවා නියුක්තිය පුද්ගලයින් 9, 660 කි.

**නිෂ්පාදනය**

1986 දී කර්මාන්තවල නිෂ්පාදනයේ වටිනාකම මූර්ත වශයෙන් සියයට 12 කින් වැඩි වී ඇත. මෙය 1985 වර්ෂයේ සියයට 5 ක වර්ධනය හා සසඳා බලන කල විශාල වැඩි වීමකි. ඛනිජ තෙල් නිමැවුමේ වටිනාකම මුළු කර්මාන්ත නිමැවුමේ වටිනාකමින් ඉවත් කොට බැලුවොත් කර්මාන්ත නිමැවුම සියයට 14 කින් වැඩි වී ඇති බව පෙනී යයි.

1986 දී නිෂ්පාදනයේ විශාල වැඩි වීමක් වාර්තා කළ කර්මාන්ත අනු අංශ නම් මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 58), රෙදිපිළි, ඇහළුම් සහ සම් නිෂ්පාදිත (සියයට 22), ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (සියයට 14), ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත (සියයට 7), රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත (සියයට 8), සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 7) සහ කඩදසි හා කඩදසි නිෂ්පාදිත (සියයට 8) වේ. දේශීය දැව සැපයුමේ හිඟය හේතුකොටගෙන දැව හා දැව නිෂ්පාදිත අංශයේ නිමැවුම වර්ෂය තුළදී සියයට 13 කින් පහත වැටුණි.

ආයෝජන ප්‍රවර්ධන කලාප ඇතුළත මෙන්ම පිටතද ඇඟළුම් කර්මාන්ත අංශයේ නිමැවුම් මට්ටම ඉහළ මට්ටමක පැවතීම රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත අංශයේ නිමැවුම සැළකිය යුතු ලෙස වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. දුම්කොළ, තිරිඟු පිටි, කිරි ආහාර, සීනි ආශ්‍රිත නිෂ්පාදිත, විස්කෝතු, චොකලට් සහ බේකරි නිෂ්පාදිත වැනි කාර්මික නිෂ්පාදිත රාශියක නිමැවුම වැඩි වීම ආහාර, පාන වර්ග සහ දුම්කොළ අංශයේ ඉහළ නිෂ්පාදන මට්ටමට ප්‍රධාන වශයෙන් දයක විය. ඛනිජ තෙල් සහ ටයර් යන රාජ්‍ය අංශයේ නිෂ්පාදන ඉහළ යාමත් ගිනිකූරු, ප්ලාස්ටික් නිෂ්පාදිත, පී. වී. සී. නළ සහ ඖෂධ වර්ග යන පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිමැවුමේ වර්ධනයත් රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත යන අංශයේ නිමැවුම ප්‍රසාරණය වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. සකස් කළ ලෝහ නිෂ්පාදිත අංශයේ ප්‍රගතියට මූලික වශයෙන් හේතු වූයේ රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ නිමැවුමේ ඇති වූ වර්ධනයයි. එසේම කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ, මහන යන්ත්‍ර, වතුර පොම්ප සහ විදුලිය උපකරණ වැනි පෞද්ගලික අංශයේ කර්මාන්ත රාශියක ඉහළ

නිමැවුම් මට්ටමක් වාර්තා විය. මූලික ලෝහ නිෂ්පාදිත අංශයේ නිමැවුම වැඩි වීමට හේතු වූ ප්‍රධාන සාධකය වූයේ ලංකා වානේ සංස්ථාවේ වූ සතුටුදායක ක්‍රියාකාරිත්වයයි. ශ්‍රී ලංකා සිමෙන්ති සහ ලංකා පිඟන් භාණ්ඩ සංස්ථාවේ නිමැවුමේ වර්ධනය ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතවල නිමැවුමේ ඉහළ වර්ධන වේගයට හේතු විය. දැව හා දැව නිෂ්පාදිත අංශයේ නිමැවුම පහත වැටීමට ප්‍රධාන හේතුව වූයේ ලංකා තුනී ලෑලි සංයුක්ත මණ්ඩලයේ සහ රාජ්‍ය දැව සංස්ථාවේ නිෂ්පාදන මට්ටම අඩු වීමයි.

### 1 . 15 සංඛ්‍යා සටහන

### කාර්මික නිෂ්පාදන වටිනාකම 1982—1986

රුපියල් දශ ලක්ෂ

| කාර්මික ගණය | 1982 | 1983 | 1984 | 1985 | 1986 (අ) |
|---|---|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ .. | 5,246 | 6,998 | 8,623 | 10,497 | 12,129 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත .. | 3,863 | 5,136 | 7,565 | 9,505 | 12,088 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 361 | 522 | 640 | 705 | 632 |
| 4. කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත .. | 725 | 901 | 907 | 1,187 | 1,289 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛණිජ තෙල්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත .. | 13,099 | 11,888 | 14,328 | 13,104 | 11,088 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) .. | 1,370 | 1,468 | 1,829 | 1,854 | 2,053 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත .. | 262 | 302 | 199 | 123 | 281 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ .. | 904 | 1,129 | 1,456 | 1,592 | 1,757 |
| 9. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත .. | 74 | 90 | 106 | 125 | 136 |
| එකතුව .. | 25,904 | 28,434 | 35,653 | 38,692 | 41,453 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) තාවකාලික

1986 කර්මාන්ත නිමැවුම වර්තන වටිනාකම අනුව සියයට 7 කින් වර්ධනය වී ඇත. මෙය 1985 දී සියයට 9 කි. මූර්ත වටිනාකම් අනුව කර්මාන්ත නිමැවුමේ වර්ධනය හා සාපේක්ෂව බලන කල වර්තන වටිනාකම් අනුව මෙසේ අඩු වර්ධන වේගයක් පෙන්වීමට ප්‍රධාන හේතුව වූයේ ආනයනය කරන ලද බොර තෙල්වල සාමාන්‍ය මිලේ තියුණු පහත වැටීමකි (සියයට 43). වර්තන වටිනාකම අනුව ඛනිජ තෙල් නිෂ්පාදිතවල නිෂ්පාදන වටිනාකම සියයට 19 කින් අඩු විය. ඛනිජ තෙල් නිෂ්පාදිතවල වටිනාකම ඉවත් කළවිට කර්මාන්ත නිෂ්පාදනය සියයට 17 කින් වැඩි වී ඇතැයි ගණන් බලා ඇත. මෙම වැඩි වීම ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා ඇඟළුම් (සියයට 27 කින්) සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 16 කින්) යන අංශවල වර්ධනය නිසා ඇති වූවකි. එසේම ලෝහ නොවන ඛනිජමය නිෂ්පාදිත (සියයට 11), සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 15) සහ කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත (සියයට 9) යන අංශවල නිෂ්පාදනයද විශාල ලෙස වැඩි විය. දැව හා දැව නිෂ්පාදිත අංශයේ සහ රසායනික ද්‍රව්‍ය සහ ඛනිජ තෙල් නිෂ්පාදිත අංශවල නිෂ්පාදන වටිනාකමේ පහත වැටීම පිළිවෙලින් සියයට 10 ක් හා සියයට 15 ක් විය. රසායනික ද්‍රව්‍ය සහ ඛනිජ තෙල් නිෂ්පාදිතවල වටිනාකම අඩු වීමට ඛනිජ තෙල්වල සාමාන්‍ය ආනයන මිලේ පහත වැටීම හේතු විය.

**රාජ්‍ය අංශයේ කර්මාන්ත**

වසර තුළදී රාජ්‍ය අංශයේ කර්මාන්ත කිහිපයක ක්‍රියාකාරිත්වයෙහි ප්‍රගතියක් දක්නට ලැබුණි. ශ්‍රී ලංකා ටයර් සංස්ථාව, ආනයන නිසා ඇති වන ප්‍රබල තරගකාරිත්වයට මුහුණ දෙමින් තම නිෂ්පාදිතයෙහි ගුණාත්මක භාවය දියුණු කිරීමේ සහ නිෂ්පාදන වියදම අඩු කිරීමේ අරමුණ

ඇතිව යන්ත්‍රාගාරය සහ යන්ත්‍ර සූත්‍ර නවීකරණය කිරීමේ වැඩ පිළිවෙලක් ඇරඹීය. 1986 වසරේදී සංස්ථාව විසින් වඩා ජනප්‍රිය ප්‍රමාණ සහ වර්ගවල ටයර් වර්ග වෙළෙඳපොළට හඳුන්වා දෙන ලදී. වසර තුළදී සම් භාණ්ඩ සංයුක්ත මණ්ඩලය විසින් සම් පදම් කිරීමේ සහ පාවැසුම් යන්ත්‍රාගාරයේ නිමැවුම් ධාරිතාවය හා කාර්යක්ෂමතාවය වැඩි කිරීම් වස් නවීකරණය කිරීමේ සහ ප්‍රසාරණය කිරීමේ වැඩ පිළිවෙලක් දියත් කරන ලදී. ජාතික ලුණු සංස්ථාව වසරකට ලුණු මෙට්‍රික් ටොන් 15,000 ක් නිෂ්පාදනය කළහැකි ' කොහොලන්කල ' නව ලේවායේ කටයුතු සැහෙන ප්‍රමාණයකින් අවසන් කොට තිබුණි.

**1 . 16 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය අංශයේ ප්‍රධාන කර්මාන්ත නිමැවුම් දර්ශකය (1977=100)**

| කාර්මික ගණය | ජනවාරි – දෙසැම්බර් | | |
|---|---|---|---|
| | 1984 | 1985 | 1986 (අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ .. | 52.5 | 48.6 | 46.8 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත .. | 140.9 | 185.9 | 208.0 |
| 2.1 රෙදිපිළි .. | 186.8 | 249.9 | 279.0 |
| 3. දුව හා දුව නිෂ්පාදිත .. | 149.1 | 139.3 | 103.4 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත .. | 117.2 | 142.8 | 160.6 |
| 5. රසායනික නිෂ්පාදිත .. | 125.1 | 109.5 | 114.9 |
| 5.1 ඛණිජ තෙල් නිෂ්පාදිත .. | 119.9 | 109.1 | 115.3 |
| 5.2 ටයර් .. | 126.4 | 130.2 | 136.4 |
| 6. ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත .. | 106.4 | 103.9 | 134.7 |
| 6.1 සිමෙන්ති .. | 111.0 | 105.2 | 115.4 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත .. | 72.7 | 40.5 | 64.1 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත .. | 87.0 | 101.8 | 134.8 |
| සියළුම කාර්මික ගණයන් .. | 112.8 | 108.1 | 116.3 |
| ඛණිජ තෙල් නිෂ්පාදිත හැර .. | 104.8 | 106.9 | 117.5 |


(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

මූර්ත වටිනාකම අනුව, 1985 වසරේදී සියයට 4 ක පහත වැටීමක් වාර්තා කරනු ලැබූ රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන්හි සමස්ත නිමැවුම 1986 වසරේදී සියයට 8 කින් ඉහළ ගියේය. මෙම ඉහළ යාම ප්‍රධාන වශයෙන් රාජ්‍ය අංශයේ සමස්ත කාර්මික නිමැවුමෙන් සියයට 52 ක දායකත්වයක් ඇති ඛණිජ තෙල් පිරිපහදුවේ නිමැවුම සියයට 6 කින් ඉහළ යෑම සහ සියයට 22 ක දායකත්වයක් ඇති රෙදිපිළි සහ සම් නිෂ්පාදිතයන්හි නිමැවුම සියයට 12 කින් ප්‍රසාරණය වීම නිසා සිදු වූවකි.

වසර තුළදී රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන් බහුතරයක නිෂ්පාදන ක්‍රියාවලීන්හි ප්‍රගතියක් විදහා දැක්විය. ලංකා වානේ (සියයට 58), රාජ්‍ය ලෝහ භාණ්ඩ (සියයට 47), ශ්‍රී ලංකා සිමෙන්ති (සියයට 47), ජාතික ලුණු (සියයට 34), ලංකා සම් භාණ්ඩ (සියයට 31), ජාතික පේෂකර්ම සහ ජාතික කඩදාසි (සියයට 12 බැගින්), ශ්‍රී ලංකා සීනි (සියයට 10), ලංකා ඛණිජ තෙල් (සියයට 6), ශ්‍රී ලංකා ටයර් (සියයට 5) යන සංස්ථාවලද සීමාසහිත බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් (සියයට 55) හා සිලෝන් සිල්ක්ස් (සියයට 13) ද නිමැවුමෙහි විශාල වැඩිවීම් වාර්තා විය. 1985 වසරේ නිමැවුම 1977 න් පසුව ඇති වූ පහත්ම නිමැවුම් මට්ටම වූ බැවින් 1986 වසරේදී ලංකා වානේ සංස්ථාවේ නිමැවුමේ ඉහළ වර්ධනයක් පෙන්නුම් කෙරිණි. වසර තුළදී මෙම සංස්ථාවේ ' රෝල් ' නිෂ්පාදනය තෙගුණයකින් සහ ' වයර් ' නිෂ්පාදනය හය

# රාජ්‍ය අංශයේ කර්මාන්ත නිමැවුම් දර්ශකය




ශ්‍රී ලංකා මහ බැංකුව.

ගුණයකින් වැඩි විය. උදළු තල, දොරවල් සහ ජනෙල් සවිකරණ සහ වාත්තු යකඩ නිමැවුම ඉහළ යාම රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ නිමැවුම් මට්ටම වැඩි වීමට හේතු විය. 1986 ජූලි–ඔක්තෝබර් කාලච්ඡේදය තුළදී පෞද්ගලික ලුණු ලේවායන්හි සතුටුදායක ක්‍රියාකාරිත්වය, ජාතික ලුණු සංස්ථාවේ නිමැවුම ඉහළ යාමට එක් හේතුවක් විය. ඇඹිලිපිටිය කම්හලේ නිමැවුම සැහෙන පමණ වැඩි වීම නිසා, ජාතික කඩදාසි සංස්ථාවේ නිමැවුම් මට්ටම ඉහළ ගියේය.

නිමැවුම් මට්ටමේ පහත වැටීමක් වාර්තා කළ රාජ්‍ය සංස්ථා අතර ලංකා තුනීලැලි (සියයට 33), රාජ්‍ය දැව (සියයට 16), ලංකා ඛණිජ වැලි (සියයට 14) සහ තෙල් සහ මේද (සියයට 6) ප්‍රධාන තැනක් ගනී.

මේ වසරේදීත් ආරක්ෂක හේතූන් මත පරන්තන් රසායන සංස්ථාව තම නිෂ්පාදනය අත්හිටුවා තිබිණි. උතුරේ පැවැති කලබලකාරී තත්ත්වයන් ලංකා ඛණිජ වැලි සංස්ථාවේ පුල්මුඩෙයි කම්හලෙහි නිමැවුම කෙරෙහි අහිතකර ලෙස බලපෑම් ඇති කරවිය. උතුරු හා නැගෙනහිර පළාත්වල දැව සැපයුමට බාධා පැමිණීම හේතුවෙන් රාජ්‍ය දැව සංස්ථාවේ නිමැවුම පහත වැටිණි. ' සාලාව ' දැව කම්හල මාස එකහමාරක් පමණ වසා තැබීම සහ ප්‍රමාණවත් දැව සැපයුමක් නොමැති වීම හේතුවෙන් තුනී ලැලි සංස්ථාවේ නිමැවුම පහත වැටිණි. අලෙවි කිරීමේ ප්‍රශ්න හේතුකොට ගෙන තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලයේ නිමැවුම අඩු විය.

රාජ්‍ය අංශයේ ව්‍යවසායයන් වාණිජමය ඵලදායිතාවයකින් යුතුව පවත්වා ගෙන යාමේ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව යමින් එම ආයතන බොහොමයක්ම මේ වසරේදී ලාභ පෙන්නුම් කරන ලදී. රාජ්‍ය පතල් කැණීම් සහ ඛනිජ සංවර්ධන සංස්ථාව සහ ජාතික කඩදාසි සංස්ථාව සිය ලාභ පිළිවෙලින් සියයට 80 කින් සහ සියයට 58 කින් වැඩි කර ගන්නා ලදී. 1986 වසරේදී ලාභ වාර්තා කළ රාජ්‍ය අංශයේ සෙසු ව්‍යවසායයන් අතර ශ්‍රී ලංකා ටයර්, ලංකා තුනී ලැලි, ලංකා පිඟන්, ලංකා තෙල් හා මේද, ජාතික ලුණු, රාජ්‍ය ස්කාගාර, රාජ්‍ය දැව, ලංකා ඛණිජ තෙල් සහ ලංකා ඛණිජ වැලි යන සංස්ථා විය. පෙර වසරවලදී අලාභ ලැබූ ලංකා වානේ සහ රාජ්‍ය ලෝහ භාණ්ඩ යන සංස්ථාවලට 1986 දී සිය අලාභ අඩු කර ගැනීමට හැකි විය.

## 1.17 සංඛ්‍යා සටහන

### කාර්මික ව්‍යවසායයන්ට කෙරෙන රාජ්‍ය අරමුදල් සංක්‍රාම 1984 – 1986

රුපියල් දශ ලක්ෂ

| සංස්ථාව/ව්‍යවසායය | ප්‍රාග්ධන | | | වර්තන | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1984 (අ) | 1985 (අ) | 1986 (ආ) | 1984 (අ) | 1985 (අ) | 1986 (ආ) | 1984 (අ) | 1985 (අ) | 1986 (ආ) |
| 1. ජාතික කිරි මණ්ඩලය .. | 7·5 | 10·3 | 2·5 | 25·1 | 50·0 | 35·0 | 32·6 | 60·3 | 37·5 |
| 2. ලංකා තෙල් හා මේද .. | 99·1 | 6·0 | — | — | — | — | 99·1 | 6·0 | — |
| 3. ශ්‍රී ලංකා සීනි .. | 410·2 | 508·3 | 150·0 | 7·1 | — | — | 417·3 | 508·3 | 150·0 |
| 4. ජාතික පේෂකර්ම .. | 127·2 | — | 42·0 | — | 30·4 | — | 127·2 | 30·4 | 42·0 |
| 5. ජාතික කඩදාසි .. | 5·6 | — | — | — | 27·1 | 8·0 | 5·6 | 27·1 | 8·0 |
| 6. රාජ්‍ය පොහොර නිපදවීමේ .. | 26·1 | — | — | 537·3 | 43·0 | 27·3 | 563·4 | 43·0 | 27·3 |
| 7. ජාතික ඇහුරුම් ද්‍රව්‍ය .. | — | — | — | 1·0 | — | — | 1·0 | — | — |
| 8. රාජ්‍ය මුද්‍රණ .. | 51·6 | 3·7 | — | — | — | — | 51·6 | 3·7 | — |
| 9. ලංකා ඔක්සිජන් සමාගම .. | — | — | — | 6·1 | 7·6 | — | 6·1 | 7·6 | — |
| එකතුව .. | 727·3 | 528·3 | 194·5 | 576·6 | 158·1 | 70·3 | 1,303·9 | 686·4 | 264·8 |

(අ) සංශෝධනය කල

(ආ) අනුමත

මූලය: මහා භාණ්ඩාගාරය

1986 වසරේදී රාජ්‍ය අංශයේ ව්‍යවසායයන්ට කරනු ලැබූ රජයේ සංක්‍රාම ගෙවීම් රුපියල් දශ ලක්ෂ 265 ක් විය. මෙයින් සියයට 74 ක් (රුපියල් දශ ලක්ෂ 195) ප්‍රාග්ධන සංක්‍රාමයන්ගෙන් සහ සියයට 26 ක් (රුපියල් දශ ලක්ෂ 70) ජංගම සංක්‍රාමයන්ගෙන් සමන්විත විය. රාජ්‍ය අංශයේ කර්මාන්ත සඳහා වූ සමස්ත රාජ්‍ය සංක්‍රාමවලින් සියයට 57 හෙවත් රුපියල් දශ ලක්ෂ 150 ක් ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයට ලැබිණ. මෙම රජයේ සංක්‍රාමයන් ලබා ගත් සෙසු සංස්ථා අතර ජාතික පේෂකර්ම සංස්ථාව, ජාතික කිරි මණ්ඩලය සහ රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාව වැදගත් වේ. රාජ්‍ය අංශයේ කර්මාන්තවලට කරන ලද සංක්‍රාම ගෙවීම් 1986 වසරේදී තවදුරටත් පහත වැටීම මෑත වසරවල සිට රාජ්‍ය අංශයේ කර්මාන්ත රජයේ අයවැය මත රැඳී සිටීමේ උපනතියෙහි අඩු වීමක් පෙන්නුම් කරයි.

## බලශක්ති සහ ඉන්ධන

1986 වසරේදී ලංකා විදුලිබල මණ්ඩලය හැර කර්මාන්තවලට අලෙවි කරනු ලැබූ ඉන්ධන ප්‍රමාණය සියයට 8 කින් පහත වැටිණ. 1985 වසර හා සැසඳීමේදී බැර ඩීසල් අලෙවිය (ලං. වි. ම. හැර) සියයට 2 කින් සහ උඳුන් තෙල් අලෙවිය සියයට 9 කින් පහත වැටී ඇති බව පෙනේ. විදුලි බලය පහසුවෙන් ලබා ගත හැකි වීම සහ එය ප්‍රධාන බලශක්ති බවට පත් වෙමින් පැවතීම මෙයින් පෙන්නුම් කරයි.

විදුලි බලය කර්මාන්ත අංශයේ ඉතාම පෘථුල ලෙස භාවිතයට ගැනෙන බලශක්තිය ලෙස අඛණ්ඩව පැවති අතර, කර්මාන්ත අංශයෙහි විදුලි බලය භාවිතය 1985 වසරට වඩා සියයට 8 කින් ඉහළ ගියේය. මෙය විශාල පරිමාණයේ කර්මාන්තවල සියයට 14 කද, මධ්‍යම පරිමාණ කර්මාන්තවල සියයට 3 කද, කුඩා පරිමාණ කර්මාන්තවල* සියයට 4 කද වැඩිවීම්වලින් සමන්විත විය.

### 1.18 සංඛ්‍යා සටහන
### කර්මාන්තයන්හි බල හා ඉන්ධන භාවිතය 1984 – 1986

| ශීර්ෂය | 1984 | 1985 | 1986 (අ) |
|---|---|---|---|
| 1. විදුලි බලය (ගිග වොට් පැය) .. | 790.9 | 850.4 | 922.0 |
| 1.1 කුඩා පරිමාණ කර්මාන්ත .. | 31.7 | 34.7 | 36.0 |
| 1.2 මධ්‍යම පරිමාණ කර්මාන්ත .. | 371.9 | 411.4 | 424.1 |
| 1.3 විශාල පරිමාණ කර්මාන්ත .. | 387.3 | 404.3 | 461.9 |
| 2. කාර්මික ඉන්ධනවල දේශීය අලෙවිය (ආ) (මෙට්‍රික් ටොන් දහස්) .. | 238.5 | 163.2 | 149.5 |
| 2.1 බැර ඩීසල් .. | 23.7 | 20.3 | 19.8 |
| 2.2 උඳුන් තෙල් .. | 214.8 | 142.9 | 129.7 |

මූලයයන්: ලංකා විදුලි බල මණ්ඩලය,
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව.

(අ) තාවකාලික
(ආ) ලංකා විදුලි බල මණ්ඩලයට කරන ලද අලෙවිය හැර

* කාර්මික නිෂ්පාදන සහ අපනයන සැකසුම් කර්මාන්තද ඇතුළත්ය. කිලෝවොට් ඇම්පියර් 50 ට අඩු ධාරිතාවයක් ඇති ඒවා කුඩා පරිමාණයේ කර්මාන්ත වශයෙන්ද, කිලෝවොට් ඇම්පියර් 50 – 500 අතර ධාරිතාවයක් ඇති ඒවා මධ්‍යම පරිමාණ කර්මාන්ත වශයෙන්ද, කිලෝවොට් ඇම්පියර් 500 ට වැඩි ධාරිතාවයක් ඇති ඒවා විශාල පරිමාණ කර්මාන්ත වශයෙන්ද නිර්වචනය කෙරේ.

**ආයෝජන ප්‍රවර්ධන කලාපය**

1986 වසරේදී මහ කොළඹ ආර්ථික කොමිසම (ම.කො.ආ.කො.) විසින් ව්‍යාපෘතීන් දහයක් අනුමත කිරීමත් සමග, 1986 වසර අවසන් වනවිට අනුමත කරනු ලැබූ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 221 ක් විය. මේවායින් ව්‍යවසායයන් 126 ක් මහ කොළඹ ආර්ථික කොමිසම සමග ගිවිසුම් අත්සන් කොට තිබිණ. කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය (ක. ආ. ප්‍ර. ක.) තුළ වාණිජමය නිෂ්පාදන කටයුතුවල නිරත වූ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 68 ක් වූ අතර, තවත් ව්‍යාපෘතීන් 19 ක් ඉන් පිටත නිෂ්පාදන කටයුතුවල නිරතව සිටියේය. 1986 වසර අවසන් වනවිට බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ (බි.ආ.ප්‍ර.ක.) ව්‍යාපෘතීන් හතරක් ක්‍රියාත්මක විය. ම. කො. ආ. කො. තුළ ක්‍රියාත්මක වෙමින් පැවැති ව්‍යාපෘතීන් අතුරින් 33 ක් මසා නිම කළ ඇඳුම් නිෂ්පාදනයේ නියැලී සිටියේය.

1986 වසරේ අනුමත කරනු ලැබූ ව්‍යාපෘතීන් අතර විදුලිය භාණ්ඩ, කළුගල් තහඩු, පිඟන් මැටියෙන් සාදන ලද කුඩා රූප, ස්වර්ණාභරණ සහ මැණික් කැපීම, වානේ ඇණ සහ මුරිච්චි, ඇහළුම්, සුවඳ විලවුන්, බුරුසු, මාලු දැල්, පරිගණක පද්ධති සහ ඔරලෝසු සහ අත් ඔරලෝසු සැකසීම ඇතුළත් විය.

1986 වසරේ ආයෝජන ප්‍රවර්ධන කලාපයේ ව්‍යවසායයන්ගෙන් ලත් අපනයන ඉපැයීම් වන රුපියල් දශ ලක්ෂ 5,459 (විගැහි දශ ලක්ෂ 166) ඉකුත් වසරේ ඉපැයීම්වලට වඩා සියයට 43 ක වැඩි වීමක් පෙන්විය. ඉකුත් වසරේදී මෙන්ම 1986 වසරේදීත් රෙදිපිළි සහ මසා නිම කළ ඇඳුම් අංශය අපනයන ඉපැයීම්වලින් පහෙන් හතරක් හිමි කර ගත්තේය.

**1 . 19 සංඛ්‍යා සටහන**

**ආයෝජන ප්‍රවර්ධන කලාපය–සේවා නියුක්තිය සහ අපනයන ඉපැයුම් 1985–1986**

| කාර්මික ගණය | 1985 | | 1986 (අ) | |
|---|---|---|---|---|
| | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට ප්‍රමාණය) | දළ අපනයන ඉපැයුම් (නැ. වි. ස.) රු. ද. ල. | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට ප්‍රමාණය) | දළ අපනයන ඉපැයුම් (නැ. වි. ස.) රු. ද. ල. |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | — | 6.4 | 471 | 21.8 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 26,541 | 3,051.8 | 33,937 | 4,415.4 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 11 | 0.4 | 24 | 1.1 |
| 4. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 1,399 | 141.1 | 1,655 | 217.7 |
| 5. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 1,267 | 122.0 | 1,648 | 206.0 |
| 6. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 135 | 51.3 | 149 | 94.2 |
| 7. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 2,493 | 234.7 | 3,237 | 259.3 |
| 8. සේවා (ආ) | 494 | 193.9 | 493 | 233.7 |
| එකතුව | 32,340 | 3,801.6 | 41,614 | 5,449.2 |

(අ) තාවකාලික
(ආ) 'එයාර් ලංකා සමාගම' හැර

මූලය : මහ කොළඹ ආර්ථික කොමිසම.